ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1809/25 – 2013 මැයි 10 වැනි සිකුරාදා – 2013.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

III වැනි කොටස – ඉඩම්

ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය:
4/3/4/2011/එෆ්එච්/355,
මගේ අංකය: බීඊආර්/04/5/2/26.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 744ඒ - දූවේගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ මු.පි.ක. 4370 දරන පිඹුරේ කැබලි අංක 01 සහ 02:

කැබලි අංක 01
ඉඩමේ නම: දූවේඕවිට; විස්තරය: ධීවර සංචාරක වැඩ පිළිවෙල යටතේ හල්කඳවිල පොළ ඉදිකිරීම සඳහා අත්කර ගැනීම; හිමිකම් කියන අය: එච්. වී. එච්. කරුණාරත්න, අංක. 325, ගාලු පාර, බේරුවල; ප්‍රමාණය: හෙක්. 0.4684.

කැබලි අංක 02
ඉඩමේ නම: දූවේඕවිට; විස්තරය: ධීවර සංචාරක වැඩ පිළිවෙල යටතේ හල්කඳවිල පොළ ඉදිකිරීම සඳහා අත්කර ගැනීම; හිමිකම් කියන අය: ඩී. ජේ. බියංකා ජයලත්, මුහන්දිරම්වත්ත, හල්කඳවිල, පයාගල; ප්‍රමාණය: හෙක්. 0.0304.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 ජූලි මස 09 වැනි දින පෙ.ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2013 ජූලි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2013 අප්‍රේල් මස 19 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 673

ශුද්ධි පත්‍රිකාවයි

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ මා විසින් පළ කළ අංක 1553/8 හා 2008 ජූනි 10 දින හා 1794/1 2013 ජනවාරි 21 ගැසට් පත්‍රවල සඳහන් හිමිකම් පරීක්ෂණය හා වන්දි පරීක්ෂණය වෙනුවට 2013 ජූලි 03 වැනි දින පෙ.ව. 10..00 ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්. එම්. ආනන්ද,
ප්‍රාදේශීය ලේකම්,
පල්ලේපොල.

මගේ අංකය: 7/3/1/13/යුධ/හමු/අත්,
ඉඩම් හා ඉඩම් ස, අමාත්‍යාං. යොමු අංකය: එල්ඩී/05/2005/ඩී/07
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු
අංකය:එල්ඩී/05/2005/ඩී/07.

2013 අප්‍රේල් මස 10 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 – 672

1A – G17619 – 350 (2013/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*